GAP ගොවිපළ වටා ආරක්ෂිත වැටක් තිබීම අවශ්‍ය වේ.




## 2. රෝපණ ද්‍රව්‍ය

- දඬු කැබලි මගින් මඤ්ඤොක්කා වගාව පිහිටුවා ගත හැක. අවම වශයෙන් සෙන්ටි මීටර 20-25 ක් පමණ දිගින් යුතු හා විෂ්කම්භය සෙන්ටි මීටර 2-2.5 ත් අතර දඬු කැබලි සිටුවීම සඳහා යෝග්‍ය වේ
- අවශ්‍යතාවය අනුව සුදුසු ප්‍රභේද තෝරා ගැනීම.

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශ කර ඇති මඤ්ඤොක්කා ප්‍රභේද-**

MU 51, CARI 555, සුරනිමල, ස්වර්ණ, ශානි, කිරි කවඩි, HORDI MU 1, HORDI රතු



මඤ්ඤොක්කා ශාකයේ මුල්වල පිෂ්ඨය ගබඩා කිරීමෙන් ඇතිවන මූලාකන්ද මඤ්ඤොක්කා අල ලෙස හඳුන්වනු ලබයි


- හානිකර පළිබෝධ (විශේෂයෙන් කෘමීන් හා වෛරස් ආදී රෝග කාරක) වලින් තොර නිරෝගී ඒවා විය යුතු අතර රෝපණ ද්‍රව්‍ය ලබාගත් ස්ථානයේ/ගොවිපළෙහි නම හා ලිපිනය, තොගය හඳුනා ගැනීමේ කාණ්ඩ අංකය, සැපයූ දිනය සටහන් කර ගැනීම.
- අංකුර මෝදු නොවූ සහ පළුදු නොවූ දඬු කැබලි හෙක්ටයාරයකට 10000 - 12000 ක ප්‍රමාණයක් ස්ථාපිත කළහැකිය.

## 3. පොහොර යෙදීම

- ඒකාබද්ධ පෝෂණ කළමණාකරණය අනුගමනය කිරීම, එනම් රසායනික මෙන්ම කාබනික පොහොර ශාකයට අවශ්‍ය අවස්ථාවේදී අවශ්‍ය ප්‍රමාණයට සුදුසු ක්‍රමවේදයකට ලබාදීම.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් සුදුසු පාංශු පරීක්ෂණ සේවාවකින් පස් පරීක්ෂා කර නිර්දේශ අනුව පොහොර යෙදීමට උනන්දු වීම.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශිත පොහොර නිර්දේශය (හෝ භාවිතා කරනු ලබන පොහොර නිර්දේශය) ලිඛිතව සටහන් කර තිබිය යුතු අතර වෙනසක් වේ නම් එයද සටහන් කර ක්‍රියාත්මක කර තිබීම.

## 6. අස්වනු නෙලීම හා පරිහරණය

- සාමාන්‍යයෙන් මාස 7 - 9 වන වගාවන් අස්වනු නෙලීම සඳහා සුදුසු වන අතර ප්‍රභේදය අනුව මෙම කාලය වෙනස් වේ.
- අලය පළුදු නොවන පරිදි ගලවා ගැනීම ඉතා වැදගත් වේ.
- සතුන්ගෙන් හා වෙනත් දූෂක මගින් ආරක්ෂාවන පරිදි පිරිසිදු තාවකාලික ස්ථානයක ගබඩා කිරීම.
- අපනයන වෙළඳපොළ සඳහා සැකසීමේ දී ඒ සඳහා සුදුසු ආකාරයට සැකසිය යුතුය.




පළුදු වූ අල වාතයට නිරාවරණය වීමෙන් අලය තුල සයනයිඩ් නැමැති විෂ රසායනිකය නිපදවීම නිසා පාරිභෝජනයට නුසුදුසු වේ



- අගය එකතු කල නිෂ්පාදන සැකසීම ගොවිපළ තුළ සිදුකරන්නනේ නම් SL-GAP සහතිකකරණය සඳහා එම ස්ථානද සලකා බැලෙන අතර ප්‍රමිතියට අනුව නිවැරදිව පවත්වාගෙන යාම ඉතා වැදගත් වේ.

### ලේබල් කිරීම හා සළකුණු කිරීම

නිෂ්පාදන ගොවිපළ තුල ඇසුරුම් කරන්නේ නම්, ගොවිපළ හා ගොවිපළ නිෂ්පාදන පාරිභෝගිකයාට පහසුවෙන් හඳුනාගැනීම (අනුරේඛනය) සඳහා නිෂ්පාදන අඩංගු ලේබලයෙහි අදාල තොරතුරු, (GAP අංකය, QR කේතය ඇතුලත්ව) පැහැදිලිව සඳහන් කිරීම.



පසු අස්වනු ප්‍රතිකර්ම සඳහා රසායනික ද්‍රව්‍ය භාවිතය අවම කර තිබිය යුතුය. රසායනික ද්‍රව්‍ය භාවිතා කළේ නම්, නිෂ්පාදනයේ ලේබලය මත එය සටහන් කිරීම වැදගත් වේ.

